සුප්‍රසිද්ධ නිමි ඇඳුම් වෙළඳසැල් ජාලයක හිමිකරු වූ ව්‍යාපාරිකයෙකු පැලවත්ත සිය නිවෙසේ පිහිනුම් තටාකයේ මියගොස් සිටිය දී හමුවීමේ සිදුවීම සම්බන්ධයෙන්, ඉරිදා ලංකාදීප පුවත්පතේ (පෙබ. 12, 2023) පළ වී තිබූ ලිපියකි. එය වාර්තා වී තිබුණේ මේ අයුරිනි.

සිරස්තලය - "අසම්මත ඇසුරෙන් මරුදුටු කෝටිපතියා"

1) අවිවාහක පුද්ගලයෙකු, තවත් අයෙකු සමඟ පවත්වා ගෙන ගිය කුමන හෝ ආකාරයක සබඳතාවයක්, "අසම්මත ඇසුරක්" ලෙසින් ලේබල් කිරීමට ඉරිදා ලංකාදීප වෙත පදනමක් තිබේ ද?

2) මිය ගිය පුද්ගලයා සමකාමී සබඳතාවයක් තිබූ බව මෙම පුවත සඳහන් කරයි. එසේ නම්, සමකාමී සබඳතාවයක් "අසම්මත ඇසුරක්" ලෙසින් ලේබල් කිරීම ඔස්සේ, සමකාමී ප්‍රජාව පිළිබඳව කොන් කිරීමේ ආකල්පයක්, ගර්හාවක් සමාජගත නොවනු ඇතිද?

3) අයෙකුගේ ලිංගික නැඹුරුතාවය පිළිබඳව අගතිගාමී, අවමානාත්මක සඳහන් යොදාගැනීම මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් ලෙසින් සැලකේ. එසේ නම්, ඝාතනයක් බවට සැක කෙරෙන මරණයකට අදාළ පුද්ගලයින් අතර පැවති බවට පැවසෙන සමකාමී සබඳතාවයක්, "අසම්මත ඇසුරක්" ලෙසින් ලේබල් කිරීම මාධ්‍ය ආචාර ධර්ම විරෝධී වාර්තාකරණයක් නොවන්නේ ද?

මූලාශ්‍ර:

https://www.apa.org/pi/lgbt/resources/language#1

https://www.editorscode.org.uk/the_code.php

